## කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ මෙහෙයුම් කමිටු සාකච්ඡාව

දිනය : 2001- 02- 28 දින පෙරවරු 10.00ට ප්‍රධාන කාර්යාලයේදී

සහභාගිත්වය

1. ඒ. ජී.ඩබ්ලිව්. නානායක්කාර මහතා සංගණන අධිකාරී සහ ජන සං.අ .ජනරාල්
2. බී. ඩී. ජී. එස්. විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. එස්. මුදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ
5. ඒ. එම්. යූ. දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
6. ඩී. ඩී. එම්. වී. පෙරේරා මහත්මිය සංඛ්‍යාලේඛනඥ
7. ජේ. දොඩම්ගොඩ මහතා සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරී හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

යෝජිත කෘෂිකාර්මික සංගණනයේ මූලික කාර්යයක් වන ගොවි කාණ්ඩ ලැයිස්තු ගත කිරීමේ උපලේඛනයේ කෙටුම්පත මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය විය. ජන හා නිවාස සංගණනයේ එච් 1 ලේඛනය අනුව යමින් ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ වල සියලුම ගොවි කාරකයන් ලැයිස්තු ගත කිරීම සිදු කෙරේ. එම ස්ථාන වල සංගණන අර්ථ දැක්වීම අනුව ගොවි කාරකයකු හෝ කිහිප දෙනෙකු සිටී නම් ඔවුන්ගේ කාරකත්වයන් අනුව ලැයිස්තු ගත කෙරෙන අතර එකම පුද්ගලයෙකු කාරකත්ව කිහිපයක් යටතේ ක්‍රියා කරන අවස්ථා ඇත්නම් ඔවුන් ගේ නම් කාරකත්වයන්ට අනුරූප වාර ගණනක් ලැයිස්තු ගත කිරීමද කෙරෙනු ඇත.

02. කෘෂිකාර්මික ගෘහ ඒකක හඳුනා ගැනීමේ ක්‍රියාවලියේදී ධීවර ගෘහ කාණ්ඩද හඳුනා ගැනීමට හැකිදැයි විමර්ශනයට භාජනය කරන ලදී. එහිදී ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මාර්ගෝපදේශ වලට අනුව පෙනී ගියේ ගොවි කාණ්ඩ වල ඉටු කෙරෙන ධීවර කටයුතු පිළිබඳවය. කෙසේ වුවද මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සලකා බැලීමට පසුව තීරණය විය.

03. ලැයිස්තු ගත කිරීමේ උපලේඛනයේදී ගොවි කාණ්ඩ සඳහා වූ තොරතුරු කෘ.සං. 1 ලේඛණයට සීමා කළයුතු කාණ්ඩ හා කෘ.සං 11 එනම් විස්තරාත්මක ප්‍රශ්න මාලාව සම්පූර්ණ කළයුතු කාණ්ඩ සඳහා සීමාවන් කුමක්දැයි තීරණය කිරීම පිණිස පහත සඳහන් නිශ්චායක සලකා බැලේ.

1. වර්ෂය තුළ ලබාගත් ආදායම
2. ඉඩම හා සතුන් පිළිබඳ ප්‍රමාණයන්
3. වෙළඳපොල සඳහා නිෂ්පාදනය කරන සහ නො කරන

මේ අනුව වඩාත් සුදුසු යැයි තීරණය කෙරුණේ 3 වන නිර්නායකයයි. ඒ අනුව සීමාවන් සකස් කොට ලැයිස්තු ගත කිරීමේ උපලේඛනය පිළියෙල කිරීමටත් එය ඉදිරි සාකච්ඡාවේදී විමසා බැලීමටත් තීරණය විය.

4. මෙම උපලේඛනය පිළිබඳව අවසන් තීරණයකට එළඹ ගෙවත්ත ගොවි කාණ්ඩය යන නිර්වචන සලකා බැලීම.

11. මීලඟ සාකච්ඡාව 2001-03-12 දින පෙරවරු 10.00 ට අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ කාර්යාලයේදී පැවැත්වීමට තීරණය විය.

පෙරවරු 12.30 ට පමණ රැස්වීමේ කටයුතු නිමවිය.

ජේ. දොඩම්ගොඩ
සං. ලේ. (කමිටු ලේකම්) 3/2